**ශීර්ෂය 310 - රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව**

**------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූනි 08 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

**------------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

**(අ) ආදායම් නොවන ලැබීම්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ඒකාබද්ධ ශේෂ පිරික්සුමෙහි හා ඒසීඒ 3 ආකෘතියෙහි භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු අග්‍රිම ප්‍රමාණය රු.267,582,744ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම ලෙස රු.570,453,873ක් දක්වා තිබීමෙන් රු.302,871,129ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරි වර්ෂවලදී මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය සකස් කිරීමේ දී මෙම දෝෂය නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | භාණ්ඩාගාරයෙන් ලැබීම් නිසි පරිදි හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |
| (ii) | ACA 3 අනුව වෙනත් මූලාශ්‍රවලින් ලද අග්‍රිම අගය වූ 323,443,439ක මුදල භාණ්ඩාගාර ප්‍රේෂණ ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි දක්වා තිබුණි. | දෝෂය ඉදිරි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | භාණ්ඩාගාර ප්‍රේෂණ නිවැරදිව හඳුනාගෙන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි ඇතුළත් කළ යුතුවේ. |
| (iii) | 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අවසාන අග්‍රිම ශේෂය, අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය සහ ACA 03 අනුව වසර අවසාන අග්‍රිම ශේෂයේ එකතුවට සමාන විය යුතු වුවද එසේ සමාන වී නොතිබූ අතර වෙනස රු.20,894,810ක් විය. | ඉදිරි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | 2021/03 රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව අග්‍රිම ශේෂය නිවැරදිව සටහන් කළ යුතුය. |

**(ආ) ගබඩා අත්තිකාරම් ගිණුම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණන ගණනය කිරීම් අනුව සමාලෝචිත වර්ෂයේ නිකුත් කළ තොගයේ පිරිවැය රු.160,397,852ක් වූ අතර මූල්‍ය ප්‍රකාශනවලට අනුව තොග නිකුත් කිරීමේ අගය රු.159,042,692ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ තොග නිකුත් කිරීමේ පිරිවැය රු.1,355,160ක් අඩුවෙන් දක්වා තිබුණු බව නිරීක්ෂණය විය. | වාර්ෂික තොග සමීක්ෂණ ක්‍රියාවලියේදී තොග කපාහැරීම් හා ගබඩාවෙන් හැර අනෙකුත් අංශ සඳහා සිදුකරන ලිපිද්‍රව්‍ය නිකුත්කිරීම් පිරිවැයකරණය නොකිරීම ආදි හේතු මත මෙම අගයන් දෙක වෙනස් වේ. | තොගය නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතුවේ. |

**(ඇ) කළවැඩ අත්තිකාරම් ගිණුම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 ප්‍රකාරව වත්කමක් එහි පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකර ධාරණ අගයට අගය කළ යුතු වුවත් කළවැඩ අත්තිකාරම් ගිණුමෙහි ජංගම නොවන වත්කම් එහි පිරිවැයට අගය කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දක්වා තිබුණු අතර සමුච්චිත ක්ෂය වෙනමම ශුද්ධ වත්කම් ස්කන්ධය යටතේ දක්වා තිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වත්කම් එහි පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කර පෙන්වීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කළ යුතුය. |
| **(ii)** | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 ප්‍රකාරව සමාලෝචිත කාල පරිච්ඡේදයේ ආරම්භක ක්ෂය කාලපරිච්ඡේදය සඳහා වූ ක්ෂය හා අවසාන සමුච්චිත ක්ෂය මූල්‍ය ප්‍රකාශනවල පැහැදිලිව සටහන් කළ යුතු උවද් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | සමාලෝචිත කාල පරිච්ඡේදයට අදාල ආරම්භක ක්ෂය හා අවසන් සමුච්චිත ක්ෂය ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයෙහි සමුච්චිත ක්ෂය තීරුවෙහි වෙන වෙනම දක්වා ඇත. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(iii)** | මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයෙහි දැක්වෙන රු.460,155ක්වූ පැරණි යන්ත්‍ර හා පිරියත ශේෂය දිගින් දිගටම පෙන්නුම් කරන අතර ඒවා භාවිතයේ නැත්නම් ගිණුම්වලින් ඉවත් කිරීමට හෝ භාවිතයේ පවතී නම් ආයු කාලය ගණනය කොට නැවත නිවැරදි ආකාරයට ගිණුම්හි දැක්වීමට කටයුතු කර නොතිබුණි. | යන්ත්‍ර ගිණුම (පැරණි)පිළිබඳ අප සතුව පවතින ලිපිගොනු වලින් විස්තරාත්මක තොරතුරු ලබා ගැනීමට නොහැකි අතර ඒ සඳහා ඉදිරියේදී සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරමි. | සත්‍ය වශයෙන්ම භාවිතා වන වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| **(iv)** | රු.24,032,253ක ක්ෂය අරමුදල,දෙපාර්තමේන්තුව විසින් බාහිරව ආයෝජනය කර නොතිබූ අතර පොදු තැන්පත් ගිණුමක රඳවාගෙන තිබී සමාලෝචිත වර්ෂයේ දී රාජ්‍ය ආදායමට බැර කර තිබුණි. එසේ වුවද 2021 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එය ආයෝජනයක් ලෙස දක්වා තිබුණි. | ක්ෂය අරමුදල් ආයෝජන ගිණුමෙහි අඩංගු මුදල ඉදිරියේදී නිවැරදිව පොත් වලින් ඉවත් කර ගැනීමට කටයුතු කරමි. | සත්‍ය වශයෙන්ම පවතින වත්කම් නිසි පරිදි හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**(ඇ) දේපල පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | ජංගම නොවන වත්කම් ප්‍රකාශයේ වෙනත් යන්ත්‍ර හා උපකරණවල එකතු වටිනාකම රු.278,401,997ක් වුවද ACA 6 ආකෘතියෙහි එම අගය රු.278,543,675ක් ලෙස සටහන් වී තිබීම හේතුවෙන් රු.141,738ක විචලතාවයක් නිරීක්ෂණය විය. | මෙම අගය නිවැරදි කර ගැනීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට දන්වා යවා ඇත. | විචලතාවයන් හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |
| **(ii)** | රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ගොඩනැගිලි තක්සේරු වටිනාකම රු.327,400,000ක් වූ අතර (ACA – 6) ආකෘතියෙහි එහි අගය රු.387,400,000ක් වූ හෙයින් රු.60,000,000ක විචලතාවයක් නිරීක්ෂණය විය. | එම තොරතුරු යාවත්කාලීන කර නොමැති අතර, ඉදිරි වර්ෂයේදී ගිණුම් ඉදිරිපත් කිරීමේදී එම දත්ත යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ. | තක්සේරු අගයන් මූල්‍ය ප්‍රකාශයන්හි දැක්විය යුතුයි. |

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 1647 (ඉ) ප්‍රකාරව වාහන ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | මෙම වර්ෂයේ සිට පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |

### 1.6.3 විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | රුපියල් 1,682,924ක්වූ ක්ෂය සංචිත අරමුදල රු.100,738,529ක්වූ ගබඩා අත්තිකාරම් තොග ගිණුම හා රු.53,161,909ක් වටිනා ලියාහරින ලද ණයගැතියන් සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් නොවීය. | අදහස් දක්වා නොමැත. | මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් සඳහා අදාළ විස්තරාත්මක උපලේඛන පවත්වා ගත යුතුය. |
| (ii) | රු.574,461,205ක්වූ කළවැඩ අත්තිකාරම් ණය ගිණුමේ රු.519,373,709ක් සඳහා පමණක් උපලේඛන ඉදිරිපත් වූ අතර රු.55,087,507ක ණයගැතියන් සඳහා උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී අවසන් ගිණුම සකස් කිරීමේදී 2010 හා 2011 වර්ෂවල උපලේඛනවලට මෙම ශේෂ ඇතුළත් කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් සඳහා අදාළ විස්තරාත්මක උපලේඛන පවත්වා ගත යුතුය. |
| (iii) | 2020 වර්ෂයට අදාල භාණ්ඩ අපහරණ වටිනාකම්, වෙන්දේසි වටිනාකම් හා භාණ්ඩ විනාශ කිරීම්වලට අදාල ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. | 2020 වර්ෂයට අදාලව වෙන්දේසි කිරීමට නිර්දේශිත ස්ථාවර වත්කම් නොවූ අතර විනාශකිරීමට ලක්කළ ස්ථාවර වත්කම් සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කරමි. | අදාල ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කල යුතුය. |
| (iv) | **තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය සඳහා තාවකාලික ගොඩනැගිල්ලක් ඉදි කිරීම**<br>ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද රු.120,175,000ක්වූ ඇස්තමේන්තුගත පිරිවැයකට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට තැපැල් දෙපාර්තමේන්තුව එකඟ වී 2020 මාර්තු 06 වන විට රු.22,199,572ක් ගෙවා තිබුණි. එසේ වුවද | මෙම කාර්යය සඳහා මුල් සැලසුම අනුව තට්ටු 3ක ගොඩනැගිල්ලක් කොළඹ කොටුව ප්‍රදේශයේ ඉදිකිරීමට තීරනය කර | මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් සඳහා අදාළ විස්තර පවත්වා ගත යුතුය. |

| | |
|---|---|
| ව්‍යාපෘතියෙහි කිසිදු ප්‍රගතියක් නොවූ අතර අයකර තිබූ මෙම මුදල කවර කටයුත්තක් සඳහා යොදවා ගත්තේද යන්න පිළිබඳව තොරතුරු ඉදිරිපත් නොවීය. | ගිවිසුම් ගතව රු.මි. 22,199,572.00 අත්තිකාරම් මුදලක්ද ගෙවා ඇත. නව සැලසුම් හා ඇස්තමේන්තු ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන 2022 වසරේ ඉටු කිරීමට කටයුතු කරනු ඇත. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1** **කළවැඩ අත්තිකාරම් ගිණුම**

---------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අවුරුදු 5 – 20 දක්වා නිරවුල් නොවූ ණයගැති ශේෂය රු.241,984,958ක්වූ අතර විස්තර ඉදිරිපත් නොවූ ණයගැති ශේෂය රු.55,087,495ක් විය. වර්ෂ 5ට අඩු නිරවුල් නොවූ ණයගැති ශේෂය ද සැලකිය යුතු මට්ටමක පවතින අතර ණයගැති ශේෂයන් නිරවුල් කර ගැනීම ඉතාමත් දුර්වල තත්ත්වයක විය. | • 2008 හා 2009 වර්ෂවලට අදාල ණයගැති ශේෂ සඳහා 2021 කළවැඩ අත්තිකාරම් ගිණුම මගින් අඩමාණ ණය වෙන් කිරීමක් සිදු කර ඇති අතර ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයෙන් එම ණය ශේෂය නිරවුල් කිරීමට අනුමැතිය ලබාගෙන ඇත. තවද මෙම ණය අය කරගැනීම සඳහා අදාල ණයගැතියන්ට ලිපි මගින් සෑම වසරක් පාසාම දැනුම් දීම් කර ඇත.<br>• 2022 වර්ෂයේ මේ වන විට ණයගැතියන්ගෙන් රු.58,181,072.53 ක මුදලක් අය කරගෙන ඇත. | ණයගැති ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2.2** **රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම**

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **(i)** | 2021 දෙසැම්බර් 31 දිනට වැඩ තහනම් කරන ලද නිලධාරියෙකුගෙන් ලැබීමට ඇති රු.142,650ක ණය මුදල වර්ෂ 05ට වැඩි කාලයක් තිස්සේ නිරවුල් කර නොතිබුණි. | වැඩ තහනම් කරන ලද නිලධාරියාට එරෙහිව නඩු පවරා ඇතත් එම මහතා නඩුවට කැඳවීම සඳහා ඔහුගේ ලිපිනය සොයාගත නොහැකි බවට නීතිපති හරහා අධිකරණය දැනුවත් කර ඇත. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | වර්ෂ 05ට වැඩි රු.415,430ක ණය මුදලක් සේවය හැර ගොස් ඇති නිලධාරින් 11 දෙනෙකුගෙන් අයවීමට තිබුණි. | ණය අයනොවීමට හේතු ලෙස නඩු පැවරීම්, පොලිසියේ ලිඛිතව ඉල්ලීම් කිරීම්, වාරික වශයෙන් ගෙවීම් හා කපා හැරීමට අනුමැතිය ඉල්ලීම් ලෙස දක්වමි. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.3 සීමා ඉක්මවීම්

රජයේ අත්තිකාරම් කාර්යයන් සඳහා පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් ඉක්මවීම් හා ළගා නොවීම් පිළිබඳ විගණන නිරීක්ෂණ පහත් දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළවැඩ අත්තිකාරම් ගිණුමේ ලැබීම්වල අනුමත අවම බැර සීමාව රු.440,000,000 සිට 340,000,000 දක්වා අඩුකර ගැනීමට අනුමැතිය ලබා ගැනිම සඳහා 2022 ජනවාරි 12 දින යොමු කර තිබුණද මේ දක්වා අනුමැතිය ලැබී නොතිබුණි. | මෙයට අදාළ කැබිනට් පත්‍රිකාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ බවට දන්වා එවා ඇත. එහි පිටපතක් මේ සමඟ ඉදිරිපත් කරමි. | සීමාවන්ට අනුගතවීමට වගබලා ගත යුතුය. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකුල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකුල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**<br>(i) XIX පරිච්ඡේදයේ 4.3.3 වගන්තිය | නිවාස අයදුම්පත් ලැබුණු වහාම නිවාස වෙන්කිරීමේ බලධාරියා විසින් පොරොත්තු ලේඛනයක ඇතුළත් කර නොතිබුණි. | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් මත ඉදිරි කටයුතු කල යුතුව ඇත. | අයදුම්පත් ලැබුණු වහාම පොරොත්තු ලේඛනයේ ඇතුළත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) XIX පරිච්ඡේදයේ 4.3.4 වගන්තිය | එක් එක් නිවාස ශ්‍රේණිය සඳහා වෙන වෙනම පොරොත්තු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | එක් එක් සේවාවන් සඳහා වෙන වෙනම පොරොත්තු ලේඛන ඇතුලත් ලිපිගොනු පවත්වා ගෙන ගිය අතර මෙම වර්ෂයේ ජනවාරි මස සිට වෙන වෙනම ලේඛනද පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. | එක් එක් නිවාස ශ්‍රේණි සඳහා වෙන වෙනම පොරොත්තු ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| **(ආ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛය 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | | | |
| (i) 8.9.1 (ආ) වගන්තිය | රු.500,000 ඉක්මවන භාණ්ඩ කොන්ත්‍රාත්තුවක් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කර නොතිබුණි. | අවශ්‍ය ද්‍රව්‍ය හා සේවාවන් කඩිනමින් ප්‍රසම්පාදනය කරගත යුතු බැවින් හා අවශ්‍ය පිරිවිතරවලට අනුව සහ අවශ්‍ය ගුණාත්මකභාවයන් තුළ සපයා ගනු ලබන බැවින් අරමුණ ඉෂ්ඨ වී ඇති බැවින් ගිවිසුමක් අත්සන් කිරීමට උනන්දුවක් නොදක්වයි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) 5.4.10 (ඇ) වගන්තිය | ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් මුදලින් සියයට දහයකට අඩු නොවන යෝග්‍ය මුදලකින් කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණි. | භාණ්ඩ ප්‍රමාදයකින් තොරව අවශ්‍ය ප්‍රමිතියෙන් සහ ගුණාත්මකභාවයෙන් ලබාදුන්විට කාර්යයසාධන බැදුම්කර ලබාගෙන විධිමත් ගිවිසුම් අත්සන් නොකරන අවස්ථා පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) **2020 ඔක්තෝබර් 02 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛය 05/2020**<br><br>03 ඡේදය | අළුත්වැඩියා කළ වාහන පිළිබඳ තොරතුරු අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා 2021 ජනවාරි 15 දිනට පෙර කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අදාල චක්‍රලේඛ විධිවිධාන පරිදි ඉදිරියේදී කටයුතු කරනු ලබන බව සඳහන් කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.5 බැරකම් හා බැදීම්වලට එළඹීම**

------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ගබඩා අත්තිකාරම් ගිණුමට අදාළව රු.78,175,586ක්වූ නිරවුල් නොවූ ණයහිමි ශේෂ පැවති අතර මින් රු.294,737ක් වර්ෂ 02ත් 05ත් අතර ශේෂයන් විය. | නිරවුල් නොවූ ණය හිමි ශේෂ පිළිබඳ තීරණයක් ගැනීම සඳහ කමිටුවක් පත් කර ඇත. එම කමිටු තීරණයට අනුව මෙම ණය හිමි ශේෂ ඉදිරියේදී නිරවුල් කරන බව කාරුණිකව දන්වා සිටිමි. | බැරකම් නිසි පරිදි පියවීමට වගබලා ගත යුතුය. |

**2.6 තැන්පත් ශේෂයන්**

-----------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| වර්ෂ දෙකකට වැඩි කාලයක් තුල නිරවුල් නොවූ ටෙන්ඩර් තැන්පතු ශේෂය රු.642,785ක් විය. | වර්ෂ දෙකකට වැඩි කාලයක් තුළ නිරවුල් නොවූ ටෙන්ඩර් තැන්පතු ශේෂයන් සඳහා අදාල ආයතන වෙත ලිපි යවා රජයේ ආදායමට බැර කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | නිරවුල් කළ හැකි තැන්පතු ශේෂයන් හඳුනාගෙන නිරවුල් කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් රු.29,991,987ක් වටිනා ලාම්පු කණු ලබා ගැනීමේ ව්‍යාපෘතිය අතර මග නවතා දමා තිබුණි. | කාර්යය සඳහා ගිවිසුම් ගතවීමක් ඉල්ලා සිටියද ගිවිසුම අත්සන් නොකල හෙයින් කාර්යය නවතා දමන ලදී. | ව්‍යාපෘති නිසි කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක කිරීමට හා නිසි කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | තැපැල් දෙපාර්තමේන්තුවේ දින මුද්‍රා 2,000ක් අළුත්වැඩියා කිරීමේ රු.1,640,000ක් වටිනා ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි සමාලෝචිත වර්ෂයේ දී ඉටුකර නොතිබුණි. | තැපැල් මුද්‍රා 2000 ක් අළුත්වැඩියා කිරීම් කාර්යය කොවිඩ් වසංගතය හේතුවෙන් ප්‍රමාද විය. එය 2022 වසරේ ඉටුකරමින් පවතී. | ව්‍යාපෘති නිසි කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක කිරීමට හා නිසි කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මහරගම අපේක්ෂා රෝහලේ රෝහල් උපකරණ සැකසීමේ රු.2,163,000ක් වටිනා ව්‍යාපෘතිය ඉටුකර නොතිබුණි. | කොවිඩ් වසංගතය හමුවේ සේවක පැමිණීම ඉතා දුර්වල වූ බැවින් හා අමුද්‍රව්‍ය ලබාගැනීමේ අපහසුතා හේතුවෙන් 2021 වසරේ කාර්යය ඉටුකිරීමට නොහැකි වූ අතර 2022 වසරේදී ඉටුකරනු ඇත. | ව්‍යාපෘති නිසි කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක කිරීමට හා නිසි කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ජලසම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයේ හපුගල ජල සම්පාදන පද්ධතියක් සපයා සවිකිරීමේ රු.231,578,258ක් වටිනා ව්‍යාපෘතිය ඉටුකර නොතිබුණි. | අවශ්‍ය අමුද්‍රව්‍ය මිල දී ගැනීමට කටයුතු කළද ප්‍රමිතියෙන් තොර අමුද්‍රව්‍ය ලැබීම හේතුවෙන් අවස්ථා ගනනාවකදී ඒවා ප්‍රතික්ෂේප විය. එබැවින් මේ දක්වා නිම කිරීමට නොහැකි වී ඇත. 2022 වසරේදී ඉදිකිරීම් කරගෙනයනු ලැබුවද, අමුද්‍රව්‍ය මිල විශාල ලෙස ඉහලයාම හේතුවෙන් ටැංකි පද්ධති 4න් 3ක් පමනක් ඉටුකරනු ලබන අතර ඒබව ජල සම්පාදන මණ්ඩලය ද දැනුවත් කර අවශ්‍ය ඉදිරි කටයුතු කරගෙන යනු ලබයි. | ව්‍යාපෘති නිසි කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක කිරීමට හා නිසි කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ජලසම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ බද්දේගම ජලසම්පාදන පද්ධතිය පිළියෙල කිරීමේ රු.159,024,118ක ව්‍යාපෘතිය ඉටු කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය සඳහා ආනයනය කර සපයනලද සියලුම අමුද්‍රව්‍ය ප්‍රමිතියෙන් තොරවීම හේතුවෙන් කාර්යය ඉටුකිරීමට නොහැකිවිය. තවද ඩොලරය ඉහලයාම හේතුවෙන් නව මිලගනන් ඉතා අධිකවීමෙන් කාර්යයේ ඇස්තමේන්තුව රු.මි 159 , රු.මි 350 දක්වා වැඩිවී ඇත. ඒ බව ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලට දන්වා අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටී. | ව්‍යාපෘති නිසි කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක කිරීමට හා නිසි කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාවේ ඔලියමුල්ල පොම්පාගාර වෙත ගේට්ටු 06ක් සැපයීමේ රු.114,376,100ක් වටිනා ව්‍යාපෘතිය ඉටුකර නොතිබුණි. | අමුද්‍රව්‍ය ලබාගැනීමේ දුෂ්කරතා හේතුවෙන් මෙම කාර්යයද ප්‍රමාදවී ඇත. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ නිලධාරීන් සමඟ සාකච්ඡාකර විකල්ප අමුද්‍රව්‍ය යොදාගෙන කාර්යය 2022 වසරේ ඉටුකිරීමට කටයුතු කරමින් පවතී. | ව්‍යාපෘති නිසි කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක කිරීමට හා නිසි කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයේ යකඩ පාලම පිළිසකර කිරීමේ රු.53,463,000ක් වටිනා ව්‍යාපෘතිය නවතා දමා තිබුණි. | සැලසුමට අනුව අමුද්‍රව්‍ය මිලදීගැනීමට යාමේදී අමුද්‍රව්‍ය මිල ඉහලයාම හේතුවෙන් ඇස්තමේන්තු මිල සංශෝධනය කර අනුමැතිය සඳහා ඉදිරිපත් කලද එයට අනුමැතිය නොලැබීම හේතුවෙන් කාර්යය අත්හිටවීමට සිදුවිය. | ව්‍යාපෘති නිසි කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක කිරීමට හා නිසි කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අලිකොටආර ව්‍යාපෘතියේ ජලපාලන දිය දොරටු තුනක් සැදීම වෙනුවෙන් රුපියල් මිලියන 05ක් ප්‍රතිපාදන වෙන් කොට තිබූ අතර එහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය සියයට 26ක තරම් අඩු මට්ටමක පැවතුණි. | කොවිඩ් වසංගතය හේතුවෙන් ඉදිකිරීම් ප්‍රමාදවූ අතර 2022 වසරේ ඉටුකිරීමට කටයුතු කර ඇත. | ව්‍යාපෘති නිසි කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක කිරීමට හා නිසි කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | තැපැල් දෙපාර්තමේන්තුව සඳහා යකඩ රාමු හා සැකිලි භාවිතා කර කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් රු. මිලියන 32ක් ප්‍රතිපාදන වෙන් කොට ඇතත් එහි මූල්‍ය ප්‍රගතිය සියයට 13.1ක් හා භෞතික ප්‍රගතිය සියයට 41ක් විය. | මෙහි මූලික සැලැස්ම තට්ටු 3ක ගොඩනැගිල්ල පසුව තනි තට්ටුවක් ලෙස වෙනස්වීම හේතුවෙන් කාර්යය අතරමග නතර කිරීමට සිදුවිය. නමුත් ඉඩම වටා තාප්පය ඉදිකිරීම ඉදිරිපස වැටක් ඉදිකිරීම් කටයුතු ඉටුකර ඇත. එබැවින් භෞතික ප්‍රගතිය අඩුවී ඇත. | ව්‍යාපෘති නිසි කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක කිරීමට හා නිසි කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ජාතික ජල සම්පාදන හා ජලපවාහන දෙපාර්තමේන්තුව සඳහා ජල පිරිපහදු ටැංකි සාදා සවිකිරීම වෙනුවෙන් රුපියල් මිලියන 80ක ඉලක්කගත ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 10ක් පමණක් වියදම් දරා ලඟා කර ගෙන තිබුණේ සියයට 13ක භෞතික ප්‍රගතියක් පමණි. | ජාතික ජල සම්පාදන මණ්ඩලයේ හපුගල ජල පිරිපහදු ටැංකි ඉදිකිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය (සුදු යකඩ) මිල දී ගැනීමට කටයුතු කළද ප්‍රමිතියෙන් තොර අමුද්‍රව්‍ය ලැබීම හේතුවෙන් අවස්ථා ගනනාවකදී ඒවා ප්‍රතික්ෂේප විය. එබැවින් භෞතික ප්‍රගතිය අඩුවිය. | ව්‍යාපෘති නිසි කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක කිරීමට හා නිසි කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඌන උපයෝජිත වත්කම්<br>පහත සඳහන් ඉඩම් හා ගොඩනැගිලි ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය. | | |
| (i) කඩා ඉවත් කරන ලද පැරණි වැඩහල් අංක 07 පවතින භූමිය | මෙම කොටසේ 2023 වර්ෂයේ වාහන අංක තහඩු මුද්‍රණය කිරීම සඳහා ගොඩනැගිල්ලක් සෑදීමට අවශ්‍ය ව්‍යාපෘති සැළැස්ම ඉදිරිපත් කර ඇත. දැනට වාහන නවතා තැබීම සඳහා යොදාගනී. | මෙම වත්කම් හඳුනාගෙන ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) මෙන්දිස්වත්තේ සේවක නිවාස 03 පිහිටි ඉඩමේ අක්කර 01 රූඩ් 03 පර්චස් 11ක ඉතිරි භූමි ප්‍රදේශය | මෙහි නිලධාරී නිවාසවල ගෙවත්ත සහ පිවිසුම් මාර්ග සහිත කොටස මෙලෙස හඳුනාගෙන ඇත. | මෙම වත්කම් හඳුනාගෙන ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (iii) දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස 30ක් පාවිච්චි නොකර ඌන උපයෝජිතව පැවතුණි. | මෙම නිල නිවාස රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ අවශ්‍යතාවය අනුව වෙන් කර ඇති අතර ඔවුන්ගේ ඉල්ලීම අනුව එම නිවාස වෙන්කර දීමට නියමිතය. | මෙම වත්කම් හඳුනාගෙන උපයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) දෙපාර්තමේන්තුව විසින් පරිහරණය කරන ඉඩම් 03ක් වෙනුවෙන් ඔප්පු දෙපාර්තමේන්තුව සතුව නොමැති අතර මිනින්දෝරු සැලැස්ම පදනම්කරගෙන ප්‍රාදේශීය ලේකම් මගින් අයිතිය තහවුරු කරගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022.04.04 දින සිට මිණින්දෝරු දෙපාර්තමේන්තුව මගින් මැණුම් කටයුතු සිදු කරමින් පවතී. එය නිමවූ පසු පැවරීමේ ලේඛන ලැබීමට නියමිතය. | මෙම වත්කම් හඳුනාගෙන උපයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ගබඩා සහ කළවැඩ අත්තිකාරම් ගිණුම් යටතේ වූ තොග සත්‍යාපන වාර්තා අනුව සියලුම අංශයන්හි පවත්වා ගෙන යනු ලබන තොග සැලකිය යුතු කාලයක් නිකුත් නොවී පවත්වාගෙන යාම තුළින් වාර්ෂිකව මේ සඳහා නඩත්තු පිරිවැයක් දැරීමටත්, ගබඩාවල ඉඩකඩ ඇහිරීමත්, තොග පරීක්ෂණය වෙනුවෙන් ශ්‍රමය හා කාලය අනවශ්‍ය ලෙස වැය වීමත්, තොග යල්පැනීමට ඉඩ ඇති බැවින් ඒවායේ වටිනාකම අඩුවීමත් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ. | | |
| (i) කළවැඩ අත්තිකාරම් ගිණුමෙහි තොග සත්‍යාපන වාර්තා අනුව 2021 දෙසැම්බර් 31 දිනට වූ තොගයෙන් රු.21,058,352ක් වටිනා තොග | විගණනය විසින් පෙන්වා ඇති එම තොග අයිතම මේවනවිට යල්පැන නොමැති බවත් ආයතනයේ හදිසි අවශ්‍යතා සඳහා එම තොග අයිතම ගබඩාවේ රඳවාගෙන තිබේ. | මෙම වත්කම් හඳුනාගෙන උපයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) ගබඩා අත්තිකාරම් ගිණුමෙහි **A** අංශයේ ගබඩාවෙහි රු.1,019,183ක් වටිනා අයිතම 152ක් | විගණනය විසින් පෙන්වා ඇති එම තොග අයිතම මේවනවිට යල්පැන නොමැති බවත් ආයතනයේ හදිසි අවශ්‍යතා සඳහා එම තොග අයිතම ගබඩාවේ රඳවාගෙන තිබේ. | මෙම වත්කම් හඳුනාගෙන උපයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) G(SP) අගයන් රු.30,912ක් වටිනා අයිතමයන් | විගණනය විසින් පෙන්වා ඇති එම තොග අයිතම මේවනවිට යල්පැන නොමැති බවත් ආයතනයේ හදිසි අවශ්‍යතා සඳහා එම තොග අයිතම ගබඩාවේ රඳවාගෙන තිබේ. | මෙම වත්කම් හඳුනාගෙන උපයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 770ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 380ක් විය. ඒ අනුව 390ක් වූ පුරප්පාඩු පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | බඳවා ගැනීම් සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණ, ප්‍රායෝගික පරීක්ෂණ පවත්වා ගැසට් නිවේදන පලකර අයදුම්පත් කැඳවා ඇති අතරම සමහර පුරප්පාඩු තනතුරුවල තරඟ විභාග ප්‍රතිඵලද බලාපොරොත්තුවෙන් පසුවේ. | දෙපාර්තමේන්තුව විසින් පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |